www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

### පුටින් ජාතිය අමතා කල දේශනය :

# එක්සත් ජනපදය හා රුසියාව අතර ආතතීන් උග්‍රවේ

## Putin's speech to the nation: Tensions increase between the US and Russia

**පැට්රික් රිච්ටර් විසිනි**
**2006 මැයි 22**

රුසියාව හා එක්සත් ජනපදය අතර උග්‍ර වන ආතතීන් ඇමතීමට යොදා ගත් කාල වකවානුව මෙයට වඩා යෝග්‍ය එකක් නොවන්නට තිබුනි. දෙවැනි ලෝක සංග්‍රාමයේ අවසානය සනිටුහන් කරන උත්සව පැවැත්වීමෙන් දිනකට පසු, එනම්, මැයි 10 වන දා, රුසියානු ජනාධිපති ව්ලැඩිමීර් පුටින් ජාතිය අමතා කරන සිය වාර්ෂික දේශනයෙහි මෙසේ ප්‍රකාශ කලේ යː "අප යුද හමුදාව වඩාත් ශක්තිමත්වත්ම, අප වෙත එවැනි පීඩන එල්ල කිරීමට පෙලඹුම වඩාත් හීන වේ." ප්‍රසිද්ධ කියමනක සඳහන් පරිදි, "තමා ගිල දැමිය යුත්තේ කවුදැයි සහෝදර වෘකයා හොඳින් දනී. සවන් දීමකින් තොරව ඔහු ගිලදමයි. පැහැදිලිව ම ඔහු කිසිවෙකුටත් සවන් නොදෙනු ඇත."

එක්සත් ජනපදයේ උග්‍රවන ආක්‍රමනශීලිබව වර්ධනය වන තර්ජනයක් ලෙස දකින මොස්කව්හි පාලක කවයන්ගේ උත්සුකයන් පැහැදිලිව නිරවුල්ව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමකය පුටින් යෙදුනේ. පුටින් මෙසේ වොෂිංටනයට දොස් පවරන්නට වියː "සිය අවශ්‍යතාවන් පසුපස හඹායෑමට උවමනා වූවිට මානව අයිතීන් හා ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම පිලිබඳ මේ අනුකම්පාව කොහිද?"

ලෝක ව්‍යාප්ත ආයුධ තරගය තවමත් අවසන් වී නැතැයි ඔහු තව දුරටත් කියා සිටියේ ය. එයට ප්‍රතිවිරුද්ධව, ඔහු කියා සිටියේ ජාත්‍යන්තර වසයෙන් "නව තාක්ෂනික මට්ටමක්" කරා ලඟාවී ඇති බව ය. ආයුධ තරගයෙහි වේගය වැඩි වෙමින් පවතී. එක්සත් ජනපද ආරක්ෂක අයවැය රුසියාවෙහි ආරක්ෂක අයවැය මෙන් 25 ගුනයකින් වැඩි බව ඔහු පෙන්වා දුන්නේ ය.

ඉරානයේ න්‍යෂ්ටික වැඩ පිලිවෙල පිලිබඳ මතභේදය සම්බන්ධයෙන් බලය යෙදීමට එරෙහිව පුටින් වක්‍රව අනතුරු ඇඟවී ය. එවැනි ක්‍රම උපයෝගි කර ගැනීමෙන් අපේක්ෂිත සාර්ථක ප්‍රතිඵල ලැබෙන්නේ ඉතාමත් කලාතුරකිනැයි ඔහු කීය.

මෑත මාස කිහිපය තුල වැඩි වැඩියෙන් එදිරිවාදී වූ වොෂිංටනයේ ස්වරයට පුටින් සිය දේශනයෙන් ප්‍රතික්‍රියා දැක්විය. මීට ටික දිනකට පෙර, "ආර්ථික ජාතිකවාදය" පිලිබඳව ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ් රුසියාවට චෝදනා කරමින් මෙසේ ප්‍රකාශ කලේ යː "අපගේ එක් උත්සුකයක් වන්නේ යම්තාක් දුරකට ආර්ථික ජාතිකවාදයයි. ඒ තුලින් දේශපාලන අරමුනු ලෙස පෙනීයන අභිප්‍රායන් මුදුන් පමුනුවා ගැනීමට ඔහු (පුටින්) සිය ඛනිජ තෙල් සමාගම් උපයෝගි කර ගනී." බුෂ් තව දුරටත් මෙසේ කීයː "ආන්ඩුවලට සංඥා නිකුත් කිරීම සඳහා යමෙකු, නිදසුනක් වසයෙන් ස්වාභාවික ගෑස් උපයෝගී කරගන්නේ නම් ඒ සම්බන්ධයෙන් අපගේ උත්සුකයන් එලිපිට ම කියා සිටිමු."

බුෂ්ගේ එම සඳහන මේ වර්ෂය මුල දී රුසියාව හා යුක්‍රේනය අතර පැනනැගුනු ගෑස් අරගලය පිලිබඳව විය. එවකට රුසියාවේ ගෑස්ප්‍රොම් සමාගම යුක්‍රේනයට ගෑස් සැපයීම තාවකාලිකව නවතා එතෙක් යුක්‍රේනය විසින් ගෙවන ලද විශේෂිත වූ මිල දෙගුන කර තිබුනි.

මේ මස මුල දී, කලින් තිබූ සෝවියට් සමූහාන්ඩුවල සංචාරයක යෙදෙන අතරවාරයේ එක්සත් ජනපද උප ජනාධිපති ඩික් චේනි පෙර නොවූ විරූ අන්දමට රුසියාවට පහර එල්ල කලේ ය. රුසියාව "ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලිය තුල පසුගාමී පියවර ගන්නේ ය"යි ඔහු චෝදනා කලේ ය. ලඟපාත රාජ්‍යයන්හි ජීවත් වන පුද්ගලයින්ගේ අයිතීන් සීමා කිරීමට බලශක්ති සැපයුම් හිතාමතා ම උපයෝගි කර ගන්නා බවටත් සිය අසල්වාසින්ගේ භෞමික ඒකීය බවට යටින් වල කපන බවටත් ඔහු රුසියාවට චෝදනා කර සිටීය. මේ රටවල ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයන් ලෙස ඔහු හැඳින්වූ වර්ධනයන්ට බලපෑම් කිරීමට මොස්කව් නගරය උත්සුක වී යයි චේනි තව දුරටත් කියා සිටියේ ය.

මේ තර්කය රුසියාව හා එක්සත් ජනපදය අතර ආතතීන් තීව්‍ර වීමේ නව උච්චස්ථානයක් සලකුනු කරයි. සෝවියට් සංගමය කඩා වැටීමෙන් අනතුරුව කිසි දිනක එක්සත් ජනපද ජනාධිපතිවරයකු හෝ උපජනාධිපතිවරයකු මේ සා විවෘතව රුසියාවට තර්ජනය කර නැත. මේ වන තෙක්, ධවල මන්දිරය දෙරට අතර පැවති "මිතුරු" සබඳතා ගැන පොදුවේ අවධාරනය කල අතර තර්ජන හා චෝදනා කිරීම්

පැවරුනේ පෙන්ටගනයටත් නොයෙකුත් බුද්ධි මන්ඩලවලටත් දෙවැනි පෙලේ නිලධාරීන්ටත් ය.

එක්සත් ජනපද ආන්ඩුව විසින් අනුගමනය කරන ලද ආක්‍රමනශීලී ආකල්පය සියලු වැදගත් සම්පත් හා වෙලඳ පොලවල ජාත්‍යන්තර ආධිපත්‍යය සුරක්ෂිත කර ගැනීමේ ඇමරිකානු පාලක ප්‍රභූවේ ප්‍රතිපත්තියක කොටසක් වේ. එක්සත් ජනපද ආධිපත්‍යයට අභියෝග කල හැකි කලාපීය බලවතුන්ගේ ශක්තිමත් වීමකට ඉඩදීමට එම ආන්ඩුව සූදානම් නැත. එය වඩාත් විවෘතව උත්සාහ දරන්නේ මිලිටරි උපක්‍රම ද ඇතුලු ක්‍රම මගින් බලගතු කලාපීය ප්‍රතිමල්ලවයන් ඉස්මතුවීම වැලැක්වීමට යි.

රුසියාව නිශ්චිතව එවැනි තර්ජනයක් එල්ල කරන රටක් ලෙස එක්සත් ජනපදයට වැඩි වැඩියෙන් දිස්වේ. සෝවියට් සංගමයේ බලපෑමට යටත්ව පැවති ප්‍රදේශයෙහි එක්සත් ජනපදය විසින් සිය ආධිපත්‍යය පැනවීමේ උත්සාහයන්ට විරුද්ධවීමට රුසියානු පාලක ප්‍රභූව තමන්ටම ආවේනික වූ ප්‍රතිගාමී ස්වභාවයෙන් වසර ගනනාවක් කටයුතු කර ඇත.

රුසියාවේ සම්ප්‍රදායික මිත්‍ර පාක්ෂිකයකු වූ සර්බියාවට එරෙහි එක්සත් ජනපදය ප්‍රමුඛත්වය ගත් යුද්ධයටත් ඉන් පසු ප්‍රතිචාර මගින් බෙල්ග්‍රේඩ්හි තන්ත්‍රය වෙනස් කිරීමටත් ප්‍රතික්‍රියාවක් වසයෙන්, රුසියානු පාලක ප්‍රභූවේ බලගතු ස්තරයන් සිය ප්‍රතිපත්තිවල නව යොමුවක් ඇති කිරීම ඇරඹී ය. සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමයේ බිඳ විසිරීමෙන් පමනක් එක්සත් ජනපදය සෑහීමකට පත් නොවන බවටත් සෝවියට් සංගමය කඩාවැටීමෙන් ඉස්මතු වූ විශාලතම රාජ්‍යය වූ රුසියාවේ බලපෑම තව දුරටත් හීන කිරීමට එක්සත් ජනපදය යත්න දරන බවටත් ඔවුහු අවබෝධ කර ගෙන සිටියහ.

එක්සත් ජනපදයෙහි වැඩිවන පීඩනය ඉදිරියේ පශ්චාත්-සෝවියට් පාලනයෙහි ව්‍යුහයන් ආරක්ෂා කර ගත හැකි වූත් රුසියාවේ අවශ්‍යතා ක්ෂේත්‍රයන් තව දුරටත් පවත්වා ගත හැකි වූත් එකම මහ බලගතු රාජ්‍යයක් පිහිටුවීම පමනක් වන බවට දකින බලවේගයන් රුසියාවේ ප්‍රභූව තුල ඉස්මතු වන්නට විය.

කලින් රාජ්‍ය ධනය හා දේපලවල අයිතිකරුවන් වූ කතිපයාධිපත්‍ය සාමාජිකයන්ගේ සමාජ කන්ඩායම් යටතේ රහස්‍ය සේවාවෙහි හා යුද හමුදාවෙහි පැරනි ආරක්ෂක ව්‍යුහයන්හි නව යොමුවක් ඇරඹින. එහි ඉලක්කය වූයේ චීනයෙහි පවතින ස්වභාවයේ රාජ්‍යයක් නිර්මානය කිරීම යි. කොමියුනිස්ට් පක්ෂයේ දැඩි පාලනය යටතේ එම පක්ෂය තුලින් ම චීනයෙහි නව ධනේශ්වර ස්තරයක් නිර්මානය කර තිබුනි. මේ ප්‍රභූව තමන්ගේ ම සූරා කෑමේ කුරිරු ක්‍රම පැනවීම තුලින් ලෝක වෙලඳපොලෙහි ස්වාධීන බලවේගයක් ලෙසත් ස්ථාපිත මහ බලවතුන්ගේ ප්‍රතිමල්ලවයෙකු ලෙසත් රට ඉස්මතුවීමට ඉඩ සලසා ගනියි.

එවැනි රුසියානු රාජ්‍යයක් නිර්මානය කිරීම සඳහා ව්ලැඩිමීර් පුටින් හා අනිකුත් එවැනි අයගේ පසුබිම හා හැකියාවන් ඇති පුද්ගලයින් අවශ්‍ය වන බව ඔවුහු නිගමනය කලහ. පුටින්, පැරනි සෝවියට් මෙවලම හා නව කතිපයාධිපත්‍ය සාමාජිකයින් අතර බැඳීම්වල ජීවමාන මූර්තියකි.

සෝවියට් සංගමයේ කඩාවැටීමට පෙර පුටින් සෝවියට් විදේශ රහස් සේවාවෙහි වසර 15ක් සේවය කර තිබුනි. 1990 වසරේ සිට 1996 වසර දක්වා ඔහු ශාන්ත පීටර්ස්බර්ග් හි නගරාධිපති වූ ඇනටෝලි සොබ්චැක්ගේ ඉතාමත් වැදගත්ම උපදේශක හා දකුනත විය. රුසියාවේ දෙවැනි විශාලතම නගරය වූ එහි ප්‍රාදේශීය කතිපයාධිපත්‍ය සාමාජිකයින්ගේ ස්වයං සුපෝෂනය අධීක්ෂනය කලේ සොබ්චැක් ය. ඔහු මේ කාල වකවානුවේ වඩාත්ම දූෂිත දේශපාලකයින්ගෙන් කෙනෙකැයි පුලුල් ලෙස සැලකේ.

1996 වසරේදී සොබ්චැක් නැවත තේරී පත්වීමට අසමත්වීමෙන් පසුව පුටින් ආපසු රහස්‍ය සේවයට ඇතුලු විය. 1998 වසරේ පුටින් ෆෙඩරල් ආරක්ෂක ඒජන්සියෙහි (එෆ්එස්බී) නායකත්වය දැරී ය. මේ ඒජන්සිය සෝවියට් කාල වකවානුවෙහි පැවති කේජීබීයෙහි අනුප්‍රාප්තික සංවිධානය විය. ජනාධිපති තනතුරින් ඉවත්ව යන බොරිස් යෙල්ට්සින් විසින් 1999 වසරේ දී පුටින් නව අගමැති ලෙස තෝරා පත් කරන ලදී. 2000 වසරේ දී පුටින් යෙල්ට්සින්ගෙන් ජනාධිපති තනතුර භාරගත්තේ ය.

වැදගත් තනතුරුවලට රහස්‍ය සේවයෙහි හා යුද හමුදාවෙහි පිරිස් පත් කිරීමෙන් පුටින් වැඩ ඇරඹී ය. ඔහු ක්‍රම ක්‍රමයෙන් ජනමාධ්‍ය ස්වාධීනත්වයට අවහිර කරන්නට විය. අන් සියල්ලට ම වඩා, ඔහු කතිපයාධිපත්‍ය සාමාජිකයින් සමග නව වැඩ බෙදීමක් ඇති කර ගත්තේ ය: ආර්ථිකයෙහි පාලනය පවත්වාගෙන යෑමට කතිපයාධිපත්‍ය සාමාජිකයින්ට ඉඩ ලබාදුන් අතරේ දේශපාලන නායකත්වයෙහි වගකීම යුද හමුදාව හා රහස්‍ය සේවාව අතට පත්විය.

මේ තත්වයට විරුද්ධ වූ කතිපයාධිපත්‍ය සාමාජිකයන් ඉවත් කරන ලදි. නොඑසේ නම්, ඔවුන්ගේ බලපෑම බොහෝ සෙයින් සීමා කරන ලදී. මුල්ම ඉලක්ක අතර ජනමාධ්‍ය බලවතුන් වන බොරිස් බෙරෙසොව්ස්කි හා ව්ලැඩිමීර් ගුඩින්ස්කි වූහ. ඔවුන් පිටුවහල් කරන ලද අතර ඔවුන්ගේ ජනමාධ්‍ය ව්‍යාපාර පද්ධති කැබලි කරන ලදී. මයිකල් කොඩොර්කොව්ස්කි නමැති තෙල් කෝටිපතියා පසු ගිය වසර දෙක තුල සයිබීරියාවේ සිරගෙයක ලැග සිටී.

නව ප්‍රතිපත්තියේ හරය වූයේ විශේෂයෙන් ඛනිජ තෙල් හා ගෑස් වැනි රුසියාවේ ඉතාමත් වැදගත් වූ

සම්පත් අරබයා රජයේ පාලනය යලි පිහිටුවීම ය. වේගයෙන් නැගී එන ලෝක ව්‍යාප්ත ඉල්ලුම අතින් බලන කල, රුසියානු ආර්ථිකයේ ඉතාම වැදගත් පදනම වන මෙම සම්පත්, ක්‍රෙම්ලිනය සතු බලය මෙහෙයවීමේ ඉතාම වැදගත් ලීවරද වේ.

ගෑස්ප්‍රොම් සමාගම වඩාත් රාජ්‍යයට යටත් කිරීම සඳහා එයට නව නායකත්වයක් පත් කරන ලදී. ප්‍රගන්ස්ක්නෙෆ්ට් ගෑස් නමැති කොඩොර්කොව්ස්කිගේ ඛනිජතෙල් සමාගම ජාතික රොස්නෙස්ට් සමාගමට අන්තර්ගත කිරීමෙන් ඛනිජතෙල් කර්මාන්තය තුල එම ජාතික සමාගම ශක්තිමත් කරන ලදී. රෝමන් ඒබ්‍රමෝවිච් නමැති කතිපයාධිපත්‍ය සාමාජිකයාට අයත් සීබ්නෙෆ්ට් නමැති ඛනිජ තෙල් සමාගම ගෑස්ප්‍රොම් සමාගමට අනුබද්ධ කරන ලදි.

බලශක්ති මිල ගනන් ඉහල යාමේත් රාජ්‍ය පාලනය ශක්තිමත් කිරීමේත් ප්‍රතිඵලයක් වසයෙන් රුසියාව නයකරුගේ තත්වයෙන් නය හිමි ජාතියක තත්වයට පරිවර්තනය වූ අතර ලොව ඉහලම ගනයේ ලා සැලකිය හැකි මුදල් සංචිතයක් එක්රැස් කර ගත්තේ ය.

විශේෂයෙන්, චීනයේ දැවැන්ත බලශක්ති ඉල්ලුමෙන් වාසි ලබා ගැනීම සඳහාත් බලගතු මිත්‍ර පාක්ෂිකයකු අත් කර ගැනීම සඳහාත් චීනය සමග වඩාත් සමීප සබඳතා ගොඩනැගීමට රුසියාව සිය යලි ශක්තිමත් වූ ආර්ථික බලය යොදා ගැනීමට යත්න දරයි. රුසියාවේ සිට චීනය දක්වාත් ජපානය දක්වාත් ඛනිජතෙල් හා ගෑස් නල දැමීම පසු ගිය වසර කිහිපය තුල නොයෙක් තත්වයන් උදා කිරීමට තුඩු දුනි. සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමයේ කලින් දකුනු දිගෙහි තිබුනු ජනරජයන්ට බලපෑම් කිරීමේ හැකියාව යලි ලබා ගැනීමට මේ මගින් රුසියාවට තව දුරටත් ඉඩ ලැබේ. උස්බෙකිස්තානයේ සිය මිලිටරි කඳවුරුවලින් ඉවත්වීමට එක්සත් ජනපදයට දැනට මත් සිදු වී ඇත. කිර්ගිස්තානයේ සිය කඳවුර වසා දැමීමට එක්සත් ජනපදයට බලකිරීමට ඉඩ ඇත.

මෙය, එක්සත් ජනපදයෙහි පමනක් නොව යුරෝපයෙහි ද වැඩිවන උත්සුකයන්ට මග පාදා ඇත. කලින් පැවති සෝවියට් සංගමයේ දකුනු දිග රටවල සිය අවශ්‍යතාවන් අනතුරට භාජනය වී ඇතිවා සේ එක්සත් ජනපදය දකී. මෙම කලාපය වූ කලි වසරකට පෙර රුසියාව හා ඉරානය මග හරිමින් මධ්‍යම ආසියානු ඛනිජ තෙල් අසර්බයිජානයේ සිට ජෝර්ජියාව හරහා ලෝක වෙලඳපොලට ප්‍රවාහනය කිරීමට ඇරඹුවා වූ කලාපයකි. ඒ සමග ම චීනය නමැති ආර්ථික යෝධයා තව දුරටත් ශක්තිමත් වීමේ හේතුවෙන් තමන්ට තර්ජනයක් එල්ල වී ඇතිවා සේ එක්සත් ජනපදයට දැනේ.

බලශක්ති සැපයුම් අරබයා යුරෝපය විශාල වසයෙන් රුසියාව මත යැපේ. රුසියාව වඩාත් ලාභදායී ලෙස බලශක්ති සැපයුම් ආසියාවට අලෙවි කිරීමට අදහස් කරන නිසා රුසියානු සැපයුම්වල මිල ගනන් වැඩිකිරීම් හා කපා හැරීම් ඇතිවනු ඇතැයි යුරෝපය අපේක්ෂා කරයි.

එක්සත් ජනපදය හා යුරෝපය ද වඩාත් ආක්‍රමනශීලීවීමේ පසුබිම මෙයයි. 2003 වසරේදී ජෝර්ජියානු ආන්ඩුව පෙරලා දැමීම එක්සත් ජනපදය සංවිධානය කලේ ය. ඊට වසරකට පසුව යුක්රේන ආන්ඩුව පෙරලා දැමීම ද එක්සත් ජනපදය සංවිධානය කලේ ය. මේ තන්ත්‍ර දෙකෙහි ම එක්සත් ජනපදයට වඩාත් පක්ෂපාතී ආන්ඩු ආදේශ කෙරිනි. බෙලරුස්හි මේ වසන්තයෙහි ගන්නා ලද එවැනි ම උත්සාහයක් ඒ අවස්ථාවේ විරුද්ධ පක්ෂයට යුරෝපීය පාර්ශ්වයේ සමීප සහාය ලැබුන ද අසාර්ථක විය.

ලොව ඉතිරි කොටසට ඛනිජතෙල් හා ගෑස් සැපයුම වැලැක්වීමේ හැකියාව ඇති, චීනය හා ඉන්දියාව සමග ඇතිවන රුසියානු සන්ධානයක් පිලිබඳ බිය ජර්මානු විදේශීය ප්‍රතිපත්ති සමාජයෙහි රුසියානු ප්‍රවීනයෙකු වූ ඇලෙක්සැන්ඩර් රාර් කැටිකොට දැක්වී ය. එවැනි සන්ධානයක් "විසි එක්වැනි සියවසේ ලෝක පර්යායේ දෙවැනි 'ධ්‍රැවයක්' වනු ඇතැයි ඔහු පැහැදිලි කලේ ය.

මේ ප්‍රතිඵලය වැලැක්වීම සඳහා ය එක්සත් ජනපදය උත්සුක වන්නේ. ඒ සඳහා සූදානම්වීම කෙතරම් කඩිනමින් සිදුවේ දැයි පැහැදිලිවූයේ මෑතකදී පමනි. *ෆොරින් එෆෙයාර්ස්* (විදේශ කටයුතු පිලිබඳ) ඇමරිකානු සඟරාවෙහි පලවූ වාර්තාවකට අනුව නව තාක්ෂනික වර්ධනයන් යන්නෙන් අදහස් කෙරෙනුයේ එක්සත් ජනපදයට ඉතා ප්‍රබල න්‍යෂ්ටික සුපිරි බවක් ඇති බවය. න්‍යෂ්ටික ආයුධ සතු සියලු ම රටවලට, නිදසුනක් වසයෙන් රුසියාවට හෝ චීනයට එරෙහිව මුල්ම ප්‍රහාරය එල්ල කර එක ප්‍රහාරයකින් ඔවුන්ගේ ප්‍රතිප්‍රහාර එල්ල කිරීමේ හැකියාව විනාශ කර දැමීමට දැන් එක්සත් ජනපදය සමත් ය.

දෙවැනි ලෝක සංග්‍රාමය අවසන් වී හැට එක් වසරකට පසුව පෙර තිබූ ප්‍රචන්ඩ ජාත්‍යන්තර සබඳතාවලින් හෙබි කාලවකවානුවකට ආපසු වැටීමේ තත්වයකට මානවයා මුහුන දී සිටී. වොෂිංටනයේ හා මොස්කව්හි සිටින "වෘකයින්ට" විරුද්ධ වීම සඳහා කම්කරු පන්තිය සිය සමාජවාදී ප්‍රතිපත්තිය ජාත්‍යන්තර මට්ටමකින් ගොඩ නැගිය යුතුය. "සමාජවාදය හෝ ම්ලේච්ඡත්වය" නමැති විකල්පය ජීවිතයත් මරනයත් අතර ගැටලුවක් සේ සියලු මිනිස් වර්ගයා කෙරේ වැඩි වැඩියෙන් එල්ල වේ.

© www.wsws.org